

# කොඩියගෙ ළම

ලක්ෂමන් කොඩිතුවක්කු

## තිතක් වගේ රටක්.....
## දකින්න නැහැ හෙටක්....
## ගිල්ලා කර වටක්.... වේවිද ලේ විලක්.....

අයිස් කන්දක් දියවෙන්නා සේ අප මව්රට මේ වනවට ක්‍රමයෙන් දියවෙමින්, ගිලෙමින් පවතින්නේ දියසේන කුමාරයෙකුටවත් ගොඩ දැමීමට නොහැකි ලෙසිනි. ඒ කුඩා දූපතක් හෝ භූමිය හෝ නිසා නොවේ. ඒ දූපතේ ජීවත්වෙමින් තමන්ගේ බලය ගැන පමණක් හිතන, අමන දේශපාලන තකතීරුවන් නිසාය. පිටරටක වාසය කළද, අපි තවමත් මව්රටට ආදරය කරන පුද්ගලයෝ වෙමු. ඒ අපිට මව් රටෙන් ලැබෙන කිසිඳු වාසියකට නොවේ. නිදහස් අධ්‍යාපනයෙන් සිප්සතර හදාරා කුමක් හෝ වරදකින් අපව මෙවැනි රටවල සිරවන්නට සිදුවූ සන්තාපය නිසාය. එසේම අමන දේශපාලන තීන්දු, තීරණ ප්‍රතිපත්තිවල වරදින් මෙවැනි රටවල් වලට මනස, ශ්‍රමය දිය කළද, අප තවමත් මව් බසින් සිතමින්, සිහින දකිමින් යහපත් රටක් උදාවන්නට පෙරුම් පුරන නිසාය. අතීතයේ විඳි අම්මාගේ කිරි සුවඳ හා වෙලී තවමත් උපන් රටට ලැදිව හෘදය ස්පන්දනය වන නිසාය.

"ඇයි අපේ රටට මෙහෙම වුණේ.?"
මිතුරෙක් මගෙන් විමසුවේය.
"ඒක අපි අපෙන්ම ඇසිය යුතු ප්‍රශ්නයක් මචං. ඒ ප්‍රශ්න වලට පිළිතුරු තිබෙන්නේ අපි ළඟමයි." මම කිව්වෙමි. ඒ කතාබහ අතරතුර තවත් මිතුරන් තිදෙනෙක් අප අසලට පැමිණියහ.
"අපේ රටේ ප්‍රජාතාන්ත්‍රවාදයට ගරු කරන එක දේශපාලකයෙක්වත් ඉන්නවාද? පටු ආත්මාර්ථකාමී දේශපාලකයන්ට ප්‍රජාතාන්ත්‍රවාදීන් වෙන්න පුළුවන්ද? බෑ. ඒකට තිබෙන හොඳම උදාහරණය තමයි අද රටේ වෙමින් පවතින්නේ." මම මගේ අදහස ඉදිරිපත් කළෙමි.

"ඔය ප්‍රධාන පක්ෂ දෙකේම උන් වරින් වර බලයට ඇවිල්ලා අපේ රට විනාශ කළා. අවුරුදු හැත්තෑවක්ම අතින් අත මාරු කරගෙන රට වලපල්ලට ඇදලා දැම්මා. ඇත්තටම එදා ජේ.ආර්., මිනිහගේ වාසියට හදපු ව්‍යවස්ථාවෙන් වැඩියෙන්ම ප්‍රයෝජනය ගත්තේ චන්ද්‍රිකායි, මහින්දයි, මෛත්‍රියයි. ඒ කරුමේ තමයි අපි ගෙවන්නේ. විජේතුංග මහත්තය විතරයි ඕකට ලෝබ නැතිව අතහැරල දැම්මෙ." එක්වරම අප අතරට ඇවිත් අදහස් පෑ හතරවන මිතුරාගේ වාග් ශෛලිය තරමක් සැරය.

"ඉතින් මේවට ඇති විසඳුම් මොනවාද? කියපල්ල බලන්න." මම ඇසුවෙමි.
"වැරදි ඇති. ඒත් මේ වෙලාවේ බලය දෙන්න ඉන්න පක්ෂයක් තියෙන්නේ ජේ.වී.පි. එක විතරයි. උන්ගේ ඇඟවල්වල තමයි මඩ ගොම හුඟක්ම අඩු." තරමක් වාමාංශික අදහස් දරණ හතරවන මිතුරාගේ පිළිතුර එය විය.

"උන්ට බලය දෙන්න... නිකන් පලයන් යන්න... පිස්සු නැත්තං හොඳයි. බලයක් නැති කාලේ කෙළිය කෙළි අමතක උන් නං උන්ට දෙයි. ජේ.වී.පි. එකට බලය ගන්න ඕන්නං, භීෂණ කාලෙ උන්ගේ දෑත්වලින් මරපු අහිංසක මිනිසුන්ගේ පවුල්වලින් සමාව ගන්න ඕන. මෙහේ ඉන්න සුද්දෝ ඇබෝලගෙන් සමාව ගත්තා වගේ. ඒ වගේම බලයට ආවොත් අපි රටට මෙන්න මේ වගේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනවා කියලා සැලැස්මක් තියෙන්න ඕනේ. සමාජවාදයද නැත්තං ලිබරල්වාදී ධනේෂ්වර ක්‍රමයද ක්‍රියාත්මක කරන්නේ කියලා කෙලින් කියන්න ඕනේ. නැත්තං අනුන්ට බැන්න පළියට ජන්ද වැටෙන්නෑ. අපේ රටේ මිනිස්සු තාම උන්ට බයයි." අනෙක් තිදෙනාගෙන් එකෙකු කීවේය.
හතරවන මිතුරා සිනාසුනේය.
"ඇයි උඹ හිනාවෙන්නේ?" එක් මිතුරෙක් ඇසුවේය.

"නැහැ උඹගේ අදහස නං හොඳයි. ඒත් ඉතින් මේ ප්‍රධාන පක්ෂ දෙකේම ආණ්ඩුවලින් උතුරේ දකුණේ මරපු තරුණ කෙල්ලන්ගෙ, කොල්ලන්ගෙ, අහිංසක මිනිසුන්ගේ පවුල්වලින් සමාව අරගෙනද උන් ඔය ඡන්ද දිනන්නෙ... ජනතාව උන්ට මාරුවෙන් මාරුවට බලය දෙන්නේ. ඒ වගේම උඹ කියන ඔය ප්‍රතිපත්ති ප්‍රකාශන උන් ළඟ තිබුණට, උන් ඒවා ක්‍රියාත්මක කරනවාද? අනෙක හොරකම් කරපුව. ඒත් ඡන්දෙ දෙනවනෙ.." ඔහු කිව්වේය.

"හිටපු ආණ්ඩුවලට එහෙම කරන්න උනේ, පර බල්ලො ආයුධ අතට අරං ආණ්ඩුවට ගහපු නිසානේ. නැත්තං ආණ්ඩු උන් හොයාගෙන ගිහිල්ලා නිකරුණේ මැරුවේ නැහැනේ." එකෙක් ඔහුගේ ඇඟට කඩා පැන්නේය.

"කලබල වෙන්න එපා. පොඩ්ඩක් හිතපං. ඔය ඔක්කොම පක්ෂවල එවුන් ටික එකතු වෙලා, මුළු රටේම මිනිසුන්ගේ සමාව ගන්න කාලේ ඇවිල්ලා කියලයි මට හිතෙන්නේ. මෙහෙම ගියොත් හොරකම් කරපු එවුන් ටිකයි, මිනී මරපු එවුන් ටිකයි ඔක්කොම හිර ගෙවල්වලට දාන්න ඉස්සෙල්ලා ජනතාව මැරෙනවා. එතකොට උන් හිරගෙවල් කඩාගෙන එළියට එන්න දඟලන්නේ ජනතාව බේරගන්න කියලා. කොච්චර මැරුණත් ජනතාව උන්ව නැවත නැවත විශ්වාස කරලා ඡන්දය දෙනවා.ජන්ද කොලේ මිනිවලට දැම්මත් උන්ට කතිරෙ ගහනවා. ඒක නිසා ජනතාව ආපහු ඉපදෙන්නෙත් ණයකාරයො, හිඟන්නො වෙලා." මම කිව්වෙමි.

"ඒක නිසා තමයි මං කියන්නේ ආපහු පරණ එකෙකුටම දෙන්න ඕනෙ කියලා. ප්‍රේමදාසගෙන් පස්සෙ අපේ රටට මොකක් හරි සේවයක් කරලා තියෙන්නේ මහින්ද. ප්‍රජාතන්ත්‍රවාදය කන්නද බං? මිනිස්සු හොයන්නෙ බඩට කන්න. මන්නම් කැමති මහින්ද එනවට." එකෙක් මැදට පැන පිළිතුරු දුන්නේය.
"මං නම් කියන්නේ සජිත් තමයි අපිට දැන් ඕනකරන නායකයා. ඔය වයසක එවුන් ටික එලවලා දාලා සජිත්ට රට භාර දෙන්න




ඕන." අනෙක් මිතුරා ප්‍රති වාග් ප්‍රහාර එල්ල කළේය.

"මං නම් කැමති රනිල්ට. රනිල් බුද්ධිමත්. හොර බොරු නෑ. මිනිස්සු බොරුවට රවට්ටන්නේ නෑ."
"උඹ හොරා. මහ බැංකුව කැඩුවා. මිනීමැරුවා. කරපු එක හොඳ වැඩක් කියපං බලන්න. මහින්ද තමයි හොඳ" එකෙකු මිරිස් කරල් ගිල දැවිල්ලක් දැනුණා සේ කෑ ගැසුවේය.

"මහින්දත් හොරා. මිනිමරුවා. පවුල්වාදියා. මං කැමති අනුරට." හතරවෙනියා නැවතත් ප්‍රති ප්‍රහාර එල්ල කළේය.
"ආපෝ අනුරය ආවොත් රටම ලේ විලක් කරල තමයි පස්ස බලන්නෙ. මං කැමති සජිත්ට"
"සජිතය වියදං කරන්නේ උගේ තාත්තා හොරා කාපු සල්ලි. මිනිමරුවාගේ පුතා. තාත්තා කරපු දේ නොකරන පුතා නොට්ටිගේ පුතා කිව්වලු." තවකෙකු කීවේය.

"ඒක ඇත්ත. උඹලගෙ තාත්තල කරපුවනෙ දැන් උඹලත් කරන්නෙ." මම කිව්වෙමි.
"ඒ කිව්වෙ?"
"ඇයි? දිගටම දිගටම දිගටම කතිරෙ ගහගෙන ගහගෙන යන එක"

"කට වහගනිල්ලා මං කැමති මහින්දට"
එකෙක් සාක්කුවෙන් මිරිස් කුඩු පැකට්ටුවක් ඇද ගත්තේය.
"මං කැමති රනිල්ට. අනිත් ඔක්කෝම සෙප්පඩයෝ." අනිකා බටර් ගාන පිහියක් ඇද වැනුවේය.
"ඔය ඔක්කෝම හොරු. මං කැමති සජිත්ට."

ඉතිරි එකා වාඩිවී සිටි පුටුව ගෙන අනෙකාට දික් කළේය. රටේ නායකයා තෝරා බේරා ගන්නට බැරිව මිතුරන් සියල්ල එකම ගාලගෝට්ටියක පැටලී මරාගන්නට දඟලමින් සිටියෝය.

මම එතනින් මිදී මඳක් ඈතට දිව්වෙමි. දුවගොස් නතර වුනෙමි. හති ඇරියෙමි.

"මං හිතන්නේ කොහේ දීපංකරෙ හිටියත් ඔය එකෙක්වත් වෙනස් කරන්න කලින් උඹල වෙනස් වෙලා හිටපල්ලා. එතකොට රටත් වෙනස්වෙයි." මම කෑගැසුවෙමි.

